# Abstract No 59

## සංස්කෘත නාට්‍ය අවශ්‍යයෙන් ම සුඛාන්ත වී ද?

**චින්තා පවිත්‍රානි**
කනිෂ්ඨ අධිශිෂ්‍යත්වලාභී, සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
chinthapawithrani@gmail.com

සංස්කෘත නාට්‍ය බහුතරය සුඛාන්ත ස්වරූපයක් විශද කරයි. එනම් සුබෝත්පාදනයට තුඩු දෙන පරිදි නාට්‍යය අවසාන වීමයි. සුප්‍රකට සංස්කෘත නාට්‍යකරුවකු වූ භාස විසින් නිර්මාණය කෙරිණියි සැලකෙන ඌරුභංගය හා කර්ණභාරය යන නාට්‍ය පමණක් සුඛාන්ත ස්වරූපයෙන් බැහැර ව නිර්මාණය වී ඇත. මෙසේ සංස්කෘත නාට්‍ය බහුතරය සුඛාන්ත ස්වරූපයක් ප්‍රදර්ශනය කරන්නේ මන්ද යන්න විමර්ශනය මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි අරමුණ වේ. මේ සඳහා සංස්කෘත නාට්‍ය මෙන් ම ඒ පිළිබඳ ලියැවී ඇති විචාර ග්‍රන්ථ මූලාශ්‍රය වශයෙන් පාදක කරගනු ලැබේ. ග්‍රීක නාට්‍ය සම්ප්‍රදාය ආදියෙහි ට්‍රැජඩි කෙරෙහි විශේෂ නැඹුරුවක් පැවති නමුත් සංස්කෘත නාට්‍ය මෙසේ සුඛාන්ත කෙරෙහි නැඹුරු වීමට බලපෑ කරුණු කිහිපයක් හඳුනාගත හැකි ය. මෙම නාට්‍ය රාජ සභා ආශ්‍රිත ව පැවති විනෝදාස්වාදන මාධ්‍යයක් වූ අතර එහිලා මූලික අවධානය යොමු වූයේ රසාස්වාදනය කෙරෙහි ය. මධ්‍යකාලීන සමාජ ක්‍රමයේ බලපෑම ඒ මත පතිත ව පැවති අතර සමාජ ශෝධනය, සමාජ ගැටලු ආදිය නොව ප්‍රේක්ෂකයන් පිනවීම කෙරෙහි මූලික අවධානය යොමු විය. රජවරුන්ගේ, ප්‍රභූවරුන්ගේ ජීවිත හාස්‍යයට හා උපහාසයට භාජන කෙරුණු නමුත් එහිලා තියුණු විවේචනයක් පැවති බවක් නොපෙනේ. හාස්‍යය, ශෘංගාර ආදි රස දැනවීම ප්‍රමුඛත්වයෙහිලා ගැනිණි. යථාර්ථය කෙරෙහි යම්බඳු අවධානයක් යොමු වුව ද සෞන්දර්ය ඉතා ප්‍රබල ලෙස ඉස්මතු ව පැවතියේ ය. සංස්කෘත නාට්‍ය සඳහා මූලික වශයෙන් වස්තු විෂය වූයේ රාජ සභා ආශ්‍රිත සුව පහසු දිවි පැවැත්මයි. මධ්‍යකාලීන සමාජ ක්‍රමයේ මූලික ස්වරූපය වූ සාමූහික පැවැත්ම ද එහිලා තහවුරු කෙරුණේ වඩාත් සාමකාමී මුහුණුවරකිනි. ඉරණම ද ඛේදයට නොව අභිප්‍රේතාර්ථ සාධනයට රුකුල් දෙන ප්‍රගතිගාමී බලවේගයක් ලෙස අර්ථකථනය කෙරිණි. මානව ජීවිතයේ සුපුෂ්පිතභාවයට රැහැණි ව පවත්නා නොයෙක් බාධක කෙරෙහි එහිලා පුළුල් අවධානයක් යොමු නොවූ අතර කවර බාධක මධ්‍යයේ වුව ද අභිප්‍රේතාර්ථ සාධනය වන වග අර්ථකථනය කෙරිණි. සියල්ල සමනය වී වාද භේද දුරු වී ඉක්බිති සතුටින් විසිර යාමක් සිදුවන බව නිරූපණය විය. මෙහෙයින් කථානායක නායිකාවන්ගේ අරමුණු ඉටු වී නාට්‍යාන්තය සුඛාන්ත ස්වරූපයක් දනවන බව පැහැදිලි වේ. ඒ ඇසුරින් සැහැල්ලු ලෙස ජීවන අර්බුද විසඳා ගැනීමට දරන වෑයමක් හඳුනාගත හැකි වේ. එහෙයින් සංස්කෘත නාට්‍ය හුදු ආකස්මික ව නොව තත්කාලීන සමාජ පදනම හා විඥ්ඥාණමය නිර්මිතය මත පදනම් ව සුඛාන්ත ස්වරූපයක් දරන බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද-** සංස්කෘත නාට්‍ය සම්ප්‍රදාය, සුඛාන්ත, ශෝකාන්ත, ඉරණම, රසාස්වාදනය